**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**

**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**

**නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය 2020/2021 (විවෘත ග්‍රන්ථ පරීක්ෂණය)**

**LLU4708/LWU2314 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය**

**කාලය - පැය (03) තුනයි**

---

**දිනයඃ 2021 සැප්තැම්බර් 09** **වේලාවඃ පෙ.ව. 9.30 - ප.ව.12.30**

---

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**
**මුළු ප්‍රශ්න ගණන හය 06 යි.**
**ප්‍රශ්න හතරකට 04 පමණක් පිළිතුරු සපයන්න.**

**(1)** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති මූලික අයිතිවාසිකම් එනයින් ම අසම්පූර්ණ වේ. පවත්නා අයිතිවාසිකම්වල විෂයපථය කුමක්ද යන්න නිර්ණය කිරීමේදීත් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය තුළ සහතික කර ඇති අයිතිවාසිකම් වල නවමානයන් විග්‍රහ කිරීමේදීත් අධිකරණය වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. නූතන සංකීර්ණ සමාජයේ ස්වභාවය හේතුවෙන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්වලට පිළියම් යෙදීමේදී නිසි අර්ථකථනයන් ලබා දීමේ අභියෝගයට විනිසුරන් වර්තමානයේදී මුහුණ දී සිටින අතර එහිදී මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ සාමාන්‍ය අර්ථය තුළින් ද ඔවුන් සීමාවන්ට ලක්වේ.

**(අ)** ඉහත ප්‍රකාශය සමග ඔබ එකග වන්නේ ද ? ශ්‍රී ලංකාවේ නඩු තීන්දු නීතිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සඳහන් කරමින් ඉහත ප්‍රකාශය විශ්ලේෂණය කරන්න.

(ලකුණු 20)

**(ආ)** ඔබගේ විශ්ලේෂණයට අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන පරිච්ඡේදය ට කළ යුතු සංශෝධන මොනවාද? වෙනත් අධිකරණ බල ප්‍රදේශ වල උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

**(2)** Covid 19 ගෝලීය වසංගතය හේතුවෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ජාත්‍යන්තර මහජන සෞඛ්‍යය හදිසි අවස්ථාවක් [Public Health Emergency of International Concern (PHEIC)] 2020 ජනවාරි මස 30 වන දින ප්‍රකාශයට පත් කරන ලදී. 2020 මාර්තු මස මුල සිටම, ශ්‍රී ලංකාවද කොරෝනා වෛරසය හේතුවෙන් පීඩාවට පත් වූ අතර විවිධ ජන කොට්ඨාශ වලට හා විවිධ ආගම්වලට අයත් කොරෝනා රෝගීන්ගේ මරණ ගණනාවක් ද වාර්තා විය.

කොරෝනා වෛරසය වැළඳීමෙන් මියයන සියලු දෙනාගේම දේහයන් ආගම් භේදයකින් තොරව භූමිදානය කිරීමට රජයේ පැවති ප්‍රතිපත්තිය සහ සමහර ආගම් වල අවමංගල්‍යය චාරිත්‍රයන්ට අදාල වන ආගමික වතාවත් හා විශ්වාසයන් නොසලකා හැරීම අතර ගැටුමක් වසංගතය ආරම්භයේ සිටම රට තුළ පැවතුණි. මෙයට පිළියමක් ලෙස, කොරෝනා වෛරසය වැළඳීමෙන් මිය ගිය පුද්ගලයන්ගේ මෘත දේහයන් යම් සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව ආදාහනය කිරීමට හෝ භූමිදානය කිරීමට බලය හිමි කර දෙමින් වර්ෂ 2021 පෙබරවාරි මස 25 දිනැති අංක 2216/38 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය රජය නිකුත් කරන ලදි.

නීතිඥයන්ගේ ස්වාධීන සංගමයක් වන ලංකා නීති සංගමය,'Covid 19 සහ ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම් කෙරෙහි එහි බලපෑම' යන තේමාව යටතේ තම සඟරාවේ නව කලාපය ප්‍රකාශයට පත් කිරීමට අදහස් කරයි. නීතියේ අරමුණු වන්නේ ජනතාව සහ සමාජය අතර ගැටෙන අවශ්‍යතා අතර තුලනයක් ඇති කිරීමයි යන නෛතික න්‍යායාය මෙම කලාපය සඳහා ප්‍රස්තුත කර ගැනීමට බලාපොරොත්තු වේ.

නීති ශිෂ්‍යයකු ලෙස එම සඟරාවට ලිපියක් ලිවීම ඔබගෙන් බලාපොරොත්තු වේ. ශ්‍රී ලංකාවේ ජනතාවගේ මූලික අයිතිවාසිකම් සැලකිල්ලට ගෙන ඉහත කරුණු පැහැදිලි කරමින් සහ විශ්ලේෂණය කරමින් එම සඟරාවට ලිපිය ලියන්න.

(ලකුණු 25)

**(3)** ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ඉතිහාසය තුළ ප්‍රථම වතාවට මානව හිමිකම් ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී යාන්ත්‍රණයක් 1978 ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දෙන ලදී . කෙසේ වෙතත්, මූලික අයිතිවාසිකම් නඩු වල ක්‍රියා ක්‍රියාපටිපාටිමය අවශ්‍යතාවයන් මත අධිකරණය දැඩි ලෙස රැඳී සිටීම හේතුවෙන් මුල්කාලීනව ශ්‍රී ලංකා වේ මූලික අයිතිවාසිකම් නීති විද්‍යාව දියුණු කිරීම උදෙසා ප්‍රබල දායකත්වයක් නොලැබුණි.

පහත සඳහන් අවශ්‍යතාවයන්ගෙන් **දෙකක්** තෝරාගෙන එම අවශ්‍යතාවයන් පිළිබඳව ශ්‍රී ලංකා අධිකරණය ලබාදුන් අර්ථ නිරූපණයන් ඉහත ප්‍රකාශය ඇසුරින් සාකච්ඡා කරන්න.

**(අ)** විධායක සහ පරිපාලන ක්‍රියා

**(ආ)** උල්ලංඝනය කිරීම යෝ උල්ලංඝනයට අත්‍යාසන්න බව

**(ඇ)** මාසයේ කාල සීමාව

**(ඈ)** නඩු පැවරීමට ඇති අයිතිය

(ලකුණු 12.5 x12.5 = 25)

**(4)** සේලන් යනු මෑතකදී තම පාලන ක්‍රමයට බලය බෙදා හැරීම හඳුන්වා දුන් දිවයිනකි. මෙම බලය බෙදා හැරීම ශ්‍රී ලංකාවේ හඳුන්වා දුන් පළාත් සභා ක්‍රමයට සමානවේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමගාමී ලැයිස්තුවේ 09 වන උපලේඛනය යටතේ දක්වා ඇති විෂය කරුණක් ගැන සඳහන් වන ප්‍රඥප්තියක් සේලන් දූපතෙහි උතුරු මැද පළාතට අලුතින් පත් කරන ලද මහ ඇමතිවරයා සහ ඇමති මණ්ඩලය විසින් පළාත් සභාවේදී සම්මත කරගන්නා ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමගාමී ලැයිස්තුවට යටත්වන විෂය කරුණක් ගැන සඳහන් එම ප්‍රඥප්තියට අනුව, පළාත් සභා අධිකාරිය විසින් තීරණය කරනු ලබන පළාතේ ඕනෑම ඉදිකිරීම් සමාගමකට අදාළ විෂය යටතේ එන රජයේ කොන්ත්‍රාත් ලබා දිය හැකිය. මාස හයකට පසු, ප්‍රඥප්තියේ බලය ප්‍රකාරව පළාත් සභාව විසින් එම පළාතේ ස්ථාපිත සමාගමකට ඉදිකිරීම් කටයුතු ප්‍රදානය කරන ලදී. එම සමාගම ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට සූදානම් වන විට, එම ස්ථානයට පැමිණි උතුරු මැද පළාත් ආණ්ඩුකාරවරයා මාධ්‍යය අමතමින් කියා සිටියේ එවැනි ව්‍යාපෘතියක් සඳහා අවසර ලබා දීම රටේ ආණ්ඩුක්‍රම ව්‍යස්ථාව උල්ලංඝනය කිරීමක් වන අතර වහාම ක්‍රියාත්මක වන පරිදි ව්‍යාපෘතිය නැවැත්වීමට නියෝග කරන බවයි. එයින් දින කිහිපයකට පසුව, පළාත් සභාවේ විමසීමක් තොරව පළාත් සභාවේ විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා මහ ඇමති ධුරයට ආණ්ඩුකාරවරයා විසින් පත් කරන ලදී. කෙසේ වෙතත්, පළාත් සභාවේ බහුතර බලය තහවුරු කරගත් හිටපු මහ ඇමතිවරයා ආණ්ඩුකාරවරයාට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් සම්මත කර ගැනීමට සමත් විය.

ඉහත සිද්ධිය අනුසාරයෙන් පහත ක්‍රියාවන්ගේ නෛතික තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරන්න.

1. සමගාමී ලැයිස්තුවට යටතේ එන විෂයයක් ආවරණය වන පරිදි ප්‍රඥප්තියක් සම්මත කිරීමට පළාත් සභාව පියවර ගැනීම සහ එය පළාත තුළ ක්‍රියාත්මක කිරීමට උත්සාහ කිරීම.

11. ආණ්ඩුකාරවරයා විසින් මහ ඇමතිවරයා ඉවත් කිරීම සහ නව මහ ඇමතිවරයෙකු පත් කිරීම.

111. පළාත් සභාව මඟින් ආණ්ඩුකාරවරයා ඉවත් කිරීමේ හැකියාව.

ඔබේ පිළිතුර අදාළ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සහ නඩු නීතිය මඟින් තහවුරු විය යුතුය.

(ලකුණු 25)

**(5)** "....ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය යන සංකල්පයෙන්, ආණ්ඩුව විසින් එහි ක්‍රියාකාරකම් සාමාන්‍ය ව්‍යවස්ථාවන්ට වඩා ඉහළ නීතියයකට අනුකූල වන බවට හඟවන අතර එම ඉහළ නීති පද්ධතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම් ලේඛනයේ හෝ වෙනත් ආකාරයේ යම් මූලික නීතියක දක්නට ඇත. නූතන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදය සාමාන්‍යයෙන් බලතල බෙදීම සහ තනි පුද්ගල අයිතිවාසිකම් යන වෙනස් ආකාර දෙක ඔස්සේ ආණ්ඩුවේ බලතල ක්‍රියාත්මක කිරීම වෙත සීමා පනවයි. ආණ්ඩුවේ විවිධ ශාඛා සහ වෙනස් දේශපාලන ඒකක අතර බලතල විභේදනය කිරීමෙන් සහ ආණ්ඩුවේ අයුතු බලපෑම්වලින් ඇතැම් මූලික අයිතිවාසිකම් සහතික කිරීමෙන් නූතන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ආණ්ඩුවේ බලතල මත වන වැදගත් සීමාකිරීම් ලෙස කටයුතු කරයි."

*Keith S. Rosenn (1990)*

ශ්‍රී ලංකාවේ නූතන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සහ අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන ඇසුරෙන් ඉහත ප්‍රකාශයේ අදාළත්වය විවේචනාත්මකව විග්‍රහ කරන්න. අදාළ නඩු තීන්දු සහ උදාහරණ ඇසුරෙන් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 25)

**(6)** හොග්වාර්ට්ස් දිවයිනේ ආණ්ඩුකම ව්‍යවස්ථා ඇගයීම් සභාව සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා පත් කරන ලද තාවකාලික (ad-hoc) කමිටු සාමාජිකයෙකු ලෙස ඔබව නම් කර ඇත. "පළාත් සභාවල විධායක හා ව්‍යවස්ථාදායක බලතලඃ නීතිය ක්‍රියාත්මක කිරීම හා පවත්නා අභියෝග" යන මාතෘකාව යටතේ ඔබ විසින් සභාවට වාර්තා කිරීමට බලාපොරොත්තු වේ.

පළාත් සභාවල විධායක හා ව්‍යවස්ථාදායක බලතලවල සංයුතිය, යුතුකම්, වගකීම් සහ කාර්යක්ෂමතාව පිළිබඳව විස්තරාත්මකව විග්‍රහ කරමින් ඔබේ වාර්තාව ලියන්න.

හොග්වාර්ට්ස් දිවයිනේ පළාත් සභා ක්‍රමය ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමයට සමාන යැයි උපකල්පනය කරන්න.

(ලකුණු 25)

******* හිමිකම් ඇවිරිණි *******